# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2022

2024 ඔක්තෝබර් / නොවැම්බර්

**මානවශාස්ත්‍ර පීඨය**

**සාහිත්‍ය විචාරය (නව නිර්දේශය)**

**සංස්කෘත සාහිත්‍ය විචාරයේ ප්‍රභවය, ඡන්දස් හා සිංහල විචාර සම්ප්‍රදාය**

**LTCR 18224**

එක් කොටසකින් එක් ප්‍රශ්නය බැගින්වත් තෝරාගෙන
ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

---

## I කොටස

01. ඡන්දස හඳුන්වා, සිංහල ඡන්දස් ශාස්ත්‍රයේ ඉතිහාසය නිදසුන් ඇසුරින් සාකච්ඡා කරන්න.

02. එළු සඳැස් ලකුණෙහි සන්විදි යටතේ සාකච්ඡා කෙරෙන කරුණු පිළිබඳ විමසීමක් කරන්න.

03. පහත දැක්වෙන පද්‍යවල අරුත් දක්වා, එම ගී විරිත් නිදසුන් ඇසුරින් පැහැදිලි කරන්න.

නෙවෙන් ඇරින් වසමැ - යති පෙර අඩෙහි විසිමත්
පසඩෙහි දෙවිසිමත් වෙද - ගී ලකුණු වේ හෙ මෙසේ

වසම්හි නව නව - සෙමෙහි දස දස මත් වූ
අට තිස් මතින් බැඳියේ - උමතු ගී නම් හේ මෙසේ

වසමැ අට දස මත් - සෙමෙහි දු ඇර තෙළෙසින්
ගෙතු බහල් මත්තෙන් - බමර ගී නම් හෙ මෙසේ

නවෙ' කොළොස් වසමැ - එකොළොස බැගින් සෙමෙහි
ලුහු බහළින් බඳහොත් - යා ගී ය මේ නිදසුන්

පෙදෙන් පෙදෙ පිරියතැ - අකුරු ඩැහැ පද නැඟෙ නම්
බහල්මත් ඈ ලකුණු - දනු සඳහට හෙ මෙසේ

## II කොටස

04. සංස්කෘත කාව්‍ය විචාරයේ ප්‍රභවය හා විකාසනය පිළිබඳ සමාලෝචනයක් කරන්න.

05. රස සූත්‍රයට අනුකූලව රස නිෂ්පත්තිය සිදු වන ආකාරය පහදන්න.

06. 'පාත්‍ර ජනයා, චතුර්විධ අභිනයෙන් දෘශ්‍ය කාව්‍යයෙහි අර්ථය විශද කරයි.' විභාග කරන්න.

## III කොටස

07. සියබස්ලකරේ දැක්වෙන අලංකාර පහක් පිළිබඳ සංක්ෂිප්ත විවරණ සපයන්න.

08. සියබස්කලර පිළිබඳ හැඳින්වීමක් කොට, එහි ප්‍රථම සර්ගයේ අන්තර්ගත විචාරංග පිළිබඳ විමර්ශනයක් කරන්න.

09. කාව්‍යෝපදේශ ග්‍රන්ථයක් වශයෙන් සිදත් සඟරාවේ වැදගත්කම ඉටු-අනිටු හා ලකර අදියර ආශ්‍රයෙන් සාකච්ඡා කරන්න.

10. නූතන කාව්‍ය විචාරයෙහි ලා රසවාදයෙන් ලබා ගත හැකි පිටුබලය කෙබඳු දැයි සනිදර්ශනව පරීක්ෂා කරන්න.

(සෑම පිළිතුරකට ම ලකුණු 20 බැගිනි)

******************************